"ගණිකා" යන යෙදුම සමඟින් බැඳුණු සමාජ ගර්හාවක් ඇති බව නොතකා හැරිය හැකි කරුණක් නොවේ. එය ලිංගික ශ්‍රමිකයින් ලෙසට සේවය කරන්නන් කෙරෙහි ගර්හාත්මක, කොන් කරන සුළු ආකල්පයක් ජනිත කරවන කරයි. එය "ගණිකා මඩම" වැනි යෙදුමක් සමඟින්ද දක්නට ලැබේ.

නිදසුන් ලෙසට, පාදුක්ක පොලිස් වසමේ ලැගුම්හල් පරීක්ෂා කරන මෙහෙයුමක් අතරතුර දී, මීපේ හන්දියේ ලැගුම්හලක් ලිංගික සේවා සපයන ස්ථානයක් ලෙසින් හඳුනාගෙන, එය වටලා, එහි සේවය කරන්නන් අත්අඩංගුවට ගත් පුවත දිනමිණ සිරස්තල (පෙබරවාරි 22, 2024) තුළ දක්වා ඇති ආකාරය විමසා බැලිය හැක.

ඒ අනුව,

1) මෙවැනි පුවත් වාර්තා කිරීමේදී, "ගණිකා" යන්න වෙනුවට "ලිංගික ශ්‍රමිකයින්" හෝ "ලිංගික සේවා සපයන්නියන්/ සපයන්නන්" ලෙසත්, "ගණිකා මඩම" වැනි යෙදුමක් වෙනුවට, "ලිංගික සේවා සපයන ස්ථාන" ලෙසත් යෙදීම යෝග්‍ය නොවන්නේ ද?

2) එය ලිංගික ශ්‍රමිකයින් ලෙසින් සේවය කරන්නවුන් වෙත එල්ල වන සමාජ ගර්හාව සහ කොන් කිරීම අවම කිරීමටත්, ඒ ඔස්සේ ඇති විය හැකි ගැටළු අවම කිරීමටත් හේතු නොවන්නේ ද?

